# මාධ්‍ය නිවේදනය

## සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය - 2025

## පාසල් හා පෞද්ගලික පාසල් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත්‍ර කැඳවීම.

රජයේ හා පෞද්ගලික පාසල්වල 12 වන ශ්‍රේණියේ ශිෂ්‍ය/ශිෂ්‍යාවන් වෙනුවෙන් පැවැත්වීමට නියමිත සාමාන්‍ය තොරතුරු තාක්ෂණ (GIT) විභාගය - 2025 වර්ෂයට අදාළව විභාගය සඳහා අයදුම්පත්‍ර කැඳවීම, 2025/05/30 දින සිට 2025/06/13 දින දක්වා මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරන බව මෙයින් නිවේදනය කරමි.

02. සියලු ම අයදුම්කරුවන් තමන්ගේ විදුහල්පති/පාසල් ප්‍රධානීන් මඟින් අයදුම්පත් යොමු කිරීම කළ යුතු ය. ඒ අනුව, විදුහල්පතිවරුන්/පෞද්ගලික පාසල් ප්‍රධානීන් විසින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවි වන www.doenets.lk හෝ www.onlineexams.gov.lk/eic දෙපාර්තමේන්තු නිල ජංගම දුරකථන යෙදවුම (Mobile App) "DOE" වෙත පිවිස අදාළ උපදෙස් හොඳින් කියවා නිවැරදිව මාර්ගගත (online) ක්‍රමවේදය ඔස්සේ පමණක් අයදුම්පත්‍ර යොමු කළ යුතු වේ. **තව ද අයදුම්කරුවන්ට පෞද්ගලිකව අයදුම් කළ නොහැකිය.**

03. උක්ත විභාගය සඳහා රජයේ හා පෞද්ගලික පාසල් විදුහල්පතිවරුන් වෙත දැනටමත් ලබා දී ඇති පරිශීලක නාම (User name) හා මුරපද (Password) භාවිතයෙන් අයදුම් කළ යුතු වේ. ඉන් අනතුරුව එහි මුද්‍රිත පිටපතක් ලබාගෙන අවශ්‍ය අවස්ථාවකදී ඉදිරිපත් කිරීමට තමන් භාරයේ සුරක්ෂිතව තබා ගත යුතුය.

04. මෙම විභාගය සඳහා අයදුම්පත් යොමු කළ හැක්කේ 2025 වර්ෂයේ 12 ශ්‍රේණියේ ඉගෙනුම ලබන (2026 වර්ෂයේ අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා පළමුවර පෙනී සිටීමට නියමිත) සිසුන්ගේ අයදුම්පත් පමණි.

> පෞද්ගලික පාසල් සිසුන්ගේ සියලු ම තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීමෙන් පසුව ගාස්තු ගෙවීම් කළ යුතු ය. ගාස්තු ගෙවීම් කිරීමෙන් පසුව නැවත නවක සිසුන් ඇතුළත් කළ නොහැකිය.

05. මේ සම්බන්ධයෙන් කිසියම් විමසීමක් අවශ්‍ය වන්නේ නම් පහත දැක්වෙන දුරකථන අංක මඟින් විමසීම් කළ හැකිය.

| | | | |
|---|---|---|---|
| සෘජු දුරකථන අංක | - | 1911 | |
| | | 0112786616, 0112784537, 0112784208 | |
| ෆැක්ස් අංකය | - | 0112784422 | |
| පොදු දුරකථන අංක | - | 0112786200 | දිගුව 263, 265 , 280, 282, 443 |
| | | 0112784201 | |
| | | 0112785202 | |


ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්


tamilguru.lk